# දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම - අම්පාර
## රැස්වීම් වාර්තාව

**01.** දිනය :- 2025.02.11 වේලාව :- ප.ව. 01.00

**02.** ස්ථානය :- ඒ.අයි. වික්‍රම ශ්‍රවණාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර.

**03.** ප්‍රධානත්වය :- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා.

**04.** මෙහෙයවීම :- දිස්ත්‍රික් ලේකම් චින්තක අබේවික්‍රම මහතා.

**05.** සහභාගීත්වය :- මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා සහභාගී වූ දේශපාලන අධිකාරිය, නැගෙනහිර පළාත් සභාවේ හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන් සහ ආරක්ෂක අංශවල ප්‍රධානීන්ගේ පැමිණීමේ ලේඛනය අමුණා ඇත. (ඇමුණුම 1)

**06. පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම :-**

දිස්ත්‍රික් ලේකම්/ දිසාපති විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව අමතමින්, පැමිණ සිටි නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා, සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්, සියලුම නැගෙනහිර පළාත් අමාත්‍යාංශ ලේකම්වරු, නැගෙනහිර පළාත් සභාව නියෝජනය කරමින් පැමිණි හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන්, ආරක්ෂක අංශයේ සියළුම නිළධාරීන් ඉතා සුහදව පිළිගන්නා ලදී. අනතුරුව ගරු සභාපති වෙත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා භාර දෙන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා, සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්, , සියලුම නැගෙනහිර පළාත් අමාත්‍යාංශ ලේකම්වරු, නැගෙනහිර පළාත් සභාව නියෝජනය කරමින් පැමිණි හා දිස්ත්‍රික්කයේ සියලුම ආයතන නියෝජනය කරමින් පැමිණි නිළධාරීන්, ආරක්ෂක අංශයේ සියළුම නිළධාරීන් පිළිගෙන අද දින මෙම රැස්වීම සංවිධානය කරනු ලැබුයේ රජයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් දැනුවත් කිරීමට සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනිමට බවත් සඳහන් කරන ලදී.

**07. ආහාර සුරක්ෂිතතා වැඩසටහන පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය හා 2024 මහ කන්නයේ වගා කටයුතු පිළිබඳ දැනුවත් කිරීම.**

අම්පාර දිස්ත්‍රික් ලේකම් විසින් 2024/25 මහකන්නයේ හෙක්ටයාර 84732 ක භූමි ප්‍රමාණයක වී වගාව සිදුකල බවත්, එමගින් අපේක්ෂිත වී අස්වැන්න මෙ.ටො. 425000ක් බවත්, මෙවර ඇතිවූ ගංවතුර ආපදා තත්ත්වයෙන් කුඹුරු හෙක්ටයාර 8833ක් විනාශ වී ඇති බවත් සඳහන් කරන ලදී. මෙවර බඩඉරිඟු හෙක්ටයාර 13386 වගා කල නමුත් ඇතිවූ ගංවතුර ආපදා තත්ත්වයෙන් හෙක්ටයාර 121ක් පමණ විනාශ වී ඇති බවත් සඳහන් කරන ලදී. ගංවතුර ආපදා තත්ත්වයෙන් වී ගොවීන් 10396ක් සහ බඩඉරිඟු ගොවීන් 178 දෙනකුගේ වගාවන් හානී වී ඇති බවත් සඳහන් කරන ලදී. මෙවර ඇතිවූ ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් ගොවීන් සඳහා වූ හානිය වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා කෘෂිරක්ෂණ මණ්ඩලය විසින් හානිවූ ගොවිබිම් පරීක්ෂා කර මාස 1 ½ වැනි කෙටි කාලයක් තුල මිලියන 110ක් පමණ ඇස්තමේන්තු කර ඉන් විශාල කොටසක් ගොවීන්ගේ ගිණුම් වෙත බැර කිරීමට කටයුතු කර ඇති බවත් ඒ සඳහා සම්බන්ධවූ නිළධාරීන්ට ස්තුතිය පිරිනමන බවත් සඳහන් කරන ලදී. මෙම අවස්ථාවේදී කෘෂිරක්ෂණ මණ්ඩලය විසින් සංකේතාත්මකව වගා හානියටපත් ගොවීන් 7 දෙනකු සඳහා වන්දි පිරිනැමීම ගරු ආණ්ඩුකාරතුමන් සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා අතින් සිදු කිරීමට කටයුතු සංවිධානය කර ඇති බවත් ඒ සඳහා අවස්ථාව ලබා දෙමින් දිස්ත්‍රික් ලේකම්ගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**08.** දිස්ත්‍රික් මට්ටමින් දේශීය හා විදේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය :-

**8.1** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂ විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 02)

දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බෙ මැතිතුමා පසුගිය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කල පසුගිය විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ පාසල් සංවර්ධන ව්‍යාපෘති මේ වසරේ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විමසන ලදී. එවිට දිස්ත්‍රික් ලේකම් විසින් ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකිවූයේ මැතිවරණ කාලසීමාව බැවින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ සඳහා අවසර ලබා නොදීමත් එම ව්‍යාපෘති 2024.12.31 දින වනවිට අවසන් කිරීමට කාලය ප්‍රමාණවත් නොවීමත් නිසා බව පවසන ලදී. දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බෙ මැතිතුමා පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වාර්ථාවේ ප්‍රගතිය සම්බන්ධයෙන් කථාකිරීමට මෙවර න්‍යාය පත්‍රයේ වේලාවක් වෙන් කර නොමැති බවත් සඳහන් කරන ලදී. එවිට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් ඒ සඳහා කාලය විශාල වශයෙන් අපතේ යන බැවින් පෙර වාර්ථාව නව රැස්වීමට පෙර වට්ස්ඇප් මාර්ගයෙන් ලබා දෙන බැවින් එය අධ්‍යනය කර අඩුපාඩු ඇත්නම් පමණක් සාකච්ඡා කිරීමට ලබන වර සිට න්‍යායපත්‍රයේ වේලාවක් වෙන් කිරීමට තීරණය කරන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් මෙවර විශාල මුදලක් විවිධ ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා වෙන්ව ඇති නිසාත් මෙම ව්‍යාපෘති යෝජනා අනුමත කර ඒවායින් වඩාත්ම සුදුසුම ඵලදායී අධ්‍යාපන, මහාමාර්ග, ප්‍රවාහන,වාරිමාර්ග, අධ්‍යාපන සහ ගංවතුර නිසා හානියටපත් යටිතල පහසුකම් සංවර්ධනයට ප්‍රමුඛතාව ලබාදී ක්‍රියාවට නැංවීම සුදුසු බව යෝජනා කරන ලදී. එවිට නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා මෙම ව්‍යාපෘති අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට (NPD) ඉදිරිපත් කිරීම සඳහා තවත් සතියක කාලයක්වත් දීර්ඝ කර ගන්නා ලෙස උපදෙස් ලබාදෙන ලදී. එනිසා යෝජනා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදීම 2025.02.25 වන විට අවසන් කරන ලෙස තීරණය ගන්නා ලදී. මෙවර පළාත් සභාව වෙත ප්‍රතිපාදන ලබාදීම දෙගුණයකින් පමණ වැඩිකර ඇති බවත්, අනෙක් අමාත්‍යාංශ වලිනුත් මෙසේ ප්‍රතිපාදන ලබාදීමත් නිසා ව්‍යාපෘති තේරීමේදී කල්පනාකාරීව සිදුකලයුතු බවත් නැතිනම් එකම ව්‍යාපෘතියට ආකාර කීපයකින් ප්‍රතිපාදන වෙන් වීමෙන් අකටයුතුකම් සිදුවිය හැකි නිසාත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පළාත් සභා සහ අනෙකුත් ආයතන එක්ව කටයුතු කරමු යැයි යෝජනා කරන ලදී. තවද විශාල ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ලිපිකටයුතු සිදුකර තබාගමු යැයි යෝජනා කරන ලදී.

**8.2** වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන **(CresMPA)** අදාළ ව්‍යාපෘති ප්‍රගතිය

වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් අදාල කරුණු ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 03)

**8.3** වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඒකාබද්ධ ජලධාරා හා ජලසම්පත් කළමණාකරණ ව්‍යාපෘති **(IWWRMP)** ප්‍රගතිය

පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් අදාල කරුණු ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 04)

දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බෙ මැතිතුමා විසින් තිල්ලයියාරු විලක් සම්බන්දයෙන් සහ පට්ටයඩිපිට්ටි පාලම සම්බන්ධයෙන් විමසන ලදී. එවිට වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමේදී එම ඉඩම් 1800 වර්ෂයේ සිට ඔප්පු පවතින බවත් ලෝක බැංකු ව්‍යාපෘති එම ඉඩම්වල ක්‍රියාත්මක කිරීමට අනුමැතිය හිමි නොවන බවත්, පට්ටයඩිපිට්ටි දැනටත් මුහුදු මට්ටමේ සිට අඩි 6 පහලින් ඇති බවත් තවත් හෑරීම මගින් මුහුදු ජලය ගලා ඒමේ හැකියාවක් පවතින බවත්. ගහ මැනීම කිරීමෙන් පසු එසේ කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සොයා බලන බවත් බැවසීය.

**8.4** දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය **(CSIAP)**

නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අදාල කරුණු ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 05)

එවිට දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිසාම් කාරියප්පර් මැතිතුමා විසින් දැනට අනපේක්ෂිතව සිදුවන කාලගුණ විපර්යාශ වලට අනුකූලව වගාවන් කිරීමේ රටාව වෙනස් කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙස දන්වා සිටින ලදී.

**09. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු යෝජනා**

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01 | අම්පාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කල සතිපොළ සංවර්ධන ව්‍යාපෘතිය (මිලියන 391) (ඇමුණුම 06) | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. |
| 02 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අම්පාර විසින් ඉදිරිපත් කල ව්‍යාපෘතිය 06 (මිලියන 0.829) (ඇමුණුම 07) | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. |
| 03 | අම්පාර සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කල ව්‍යාපෘති 03 (මිලියන 26) (ඇමුණුම 08) | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. |
| 04 | වාර්මාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කල ව්‍යාපෘති 05 (මිලියන 22278.25) (ඇමුණුම 09) | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. |
| 05 | පළාත් වාර්මාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කල ව්‍යාපෘති 30 (මිලියන 233) සහ නඩත්තු ව්‍යාපෘති 32 (මිලියන 67) (ඇමුණුම 10) | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. |
| 06 | ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කල ව්‍යාපෘති 48 (මිලියන 94 ) (ඇමුණුම 11) | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. |
| 07 | මහවැලි අධිකාරිය, රඹකැන්ඔය කලාපය විසින් ඉදිරිපත් කල ව්‍යාපෘති 52 (මිලියන 57.94 ) (ඇමුණුම 12) | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. |

**10. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර විසඳුම් නොලැබුණු විශේෂ ගැටළු**

| අනු අංක | යෝජනාව | තීරණය |
|---|---|---|
| 01 | 2024 වර්ෂයේදී ජනාධිපති වැය ශීර්ෂය යටතේ පාසල් වල සංවර්ධන කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් වී තිබු නමුත් අයහපත් කාලගුණික තත්ත්ව හා මැතිවරණ කාල සීමාවන් හේතුවෙන් ඒවා ක්‍රියාත්මක කළ නොහැකි වූ බැවින් මෙම වර්ෂය සඳහා එම ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කිරීම. | අවශ්‍යතාව මත ප්‍රමුඛතාවය ලබාදී මෙම ව්‍යාපෘති ද මෙම වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් තීරණය කරන ලදී. |
| 02 | ගංවතුරින් අඛණ්ඩව හානියට පත්වන දීඝවාපි ගම්මානයේ සිට අෂ්රෆ් නගර් හරහා අක්කරපත්තු - කල්මුණ ප්‍රධාන මාර්ගයට වැටෙන අතුරු මාර්ගය ස්ථිර ලෙස නැවත ඉදිකිරීම. | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් මේ සඳහා මිලියන 150ක පමණ වියදමක් යන බව සඳහන් කරන ලදී. මෙම පාර 8Km පමණ වන බවත් කොන්ක්‍රීට් දැමිය යුතු බවත් සඳහන් කරන ලදී. නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා විසින් පළාත් සභාවේ ඒතරම් මුදල් නොමැති බවත් දැනට |

| | | |
|---|---|---|
| | | තාවකාලික පිළියම් යෙදීමටත් එය සෑදීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන ලෙසත් උපදෙස් දුනි. |
| 03 | අම්පාර දි.ලේ. කාර්යාලයෙන් අනුමැතිය දී, ඉරක්කාමම් ප්‍රාදේශීය සභා සීමාවෙහි වූ නාවලඩි ගම්මානයේ ගොවීන් 21 ක් සඳහා ලබා දී ඇති ඉඩම් වලට අදාළ ගැටළු නිරාකරණය කිරීම. | ඉරක්කාමම් ප්‍රා.ලේ. විසින් මෙම ඉඩම් දමන ඉරක්කාමම් මායිමෙ පිහිටා ඇති බවත් ඒ සඳහා කච්චේරියෙන් බලපත්‍ර ලබාදී ඇති බවත් සඳහන් කරන ලදී. දමන ප්‍රා.ලේ විසින් මෙම එක් ගොවියෙක් සඳහා අක්කර 2 බැගින් අක්කර 42 මැනීම් කිරීම සඳහා මැනුම් දෙපාර්තමේන්තුවට යවා ඇති බවත්, ඔවුන් පැමිණ පරීක්ෂා කිරීමේදී නිරවුල් සීමා නොමැති හෙයින් නැවත ඒවා අවලංගු කිරීමට උපදෙස් ලබා දුන් බවත් ඒ අනුව අවලංගු කිරීම සඳහා දන්වා යවා ඇති බවත් සඳහන් කරන ලදී. දිසාපති, පලාත් ඉඩම් කොමසාරිස් ඇතුලු අදාල නිළධාරීන් සමඟ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමට තීරණය විය. |
| 04 | දීඝවාපී, ඔලුවිල්, පොතුවිල් ප්‍රදේශවල ක්‍රීඩා පිටි අයත් ඉඩම් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම. | දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බෙ මැතිතුමා විසින් දීඝවාපි ඉඩම් ඇති බවත් ක්‍රීඩා පිටියක් සඳහා ලබා නොදෙන බවත්. ඔලුවිල් ජනතාව තම ඉඩම් වරාය සහ විශ්ව විද්‍යාලය වෙත ලබාදී ඇති බවත්, ක්‍රීඩා පිටියක් සඳහා ඉඩමක් ලබා ගැනීම දුෂ්කර බවත් පැවසීය. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් මෙම ගැටළු අදාල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වලදී විසදා ගන්නා මෙන් උපදෙස් දෙන ලදී. දීඝවාපිය ක්‍රීඩා පිටියක් සඳහා මීට වසර දෙකකට පමණ ඉහතදී ඉඩමක් ලබාදුන් බවත් දැනට එය භාවිතයට ගන්නා බවත් දිසා වන නිළධාරී විසින් පවසන ලදී. එවිට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් දැනට ක්‍රීඩා පිටි එකක් පැවතීම ප්‍රමාණවත් බව සඳහන් කරන ලද අතර මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යෝජනා ඉදිරිපත් කිරීමේදී කරුණු හරිහැටි සොයා බලා ඉදිරිපත් කරන ලෙස දැන්වීය. අඩ්ඩාලච්චේන ප්‍රා.ලේ.ඔල්විල් LRC ඉඩමක් බව පැවසීය. ඒ සඳහා සොයා බලන ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන් දැන්වීය. පොතුවිල් හි ඉඩම නගරයෙන් බැහැර ප්‍රදේශයක බවත් ඒ සඳහා සොයා බලන බව දිසා වන නිලධාරී සඳහන් කරන ලදී. |
| 05 | හැඩඔය වාරිමාර්ග ව්‍යාපෘතිය සම්බන්ධව පවතින ගැටළු නිරාකරණය කිරීම. | වාරිමාර්ග අධ්‍යක්ෂ අදහස් දක්වමින් මේ සඳහා 2012 වර්ෂයේ ශක්‍යතා අධ්‍යනයක් කර ඇති බව සඳහන් කරන ලද අතර හැඩඔය වාරිමාර්ග ව්‍යාපෘතිය සම්බන්ධව මෙම වසරේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති 07ක් (ඇමුණුම 13 ) ඉදිරිපත් කරන ලදී. පළාත් වාරිමාර්ග නියෝජ්‍ය අධ්‍යක්ෂ විසින් සාගමම් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනුවත් කරන ලදී. මෙය මොණරාගල දිස්ත්‍රික්කයටද බලපාන බැවින් මෙම ගැටළුව පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කිරීම සුදුසු බව දිගාමඩුලු |

| | | |
|---|---|---|
| | | දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බේ මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එලෙස කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් තීරණය කරන ලදී. |
| 06 | පොතුවිල් මූලික රෝහල හා සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම. | දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බේ මැතිතුමා විසින් පොතුවිල් රෝහල මධ්‍යම රජයට පවරා ගැනීමෙන් පසු තවම පළාත් සභා නිළධාරීන් නිදහස් කර නොමැති බව සඳහන් කරන ලදී.<br>පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ අදහස් දක්වමින් එම රෝහල මධ්‍යම රජයට පවරා ගැනීමේදී කැමැත්ත පළකල සේවකයන් මධ්‍යම රජයට අන්තර්ග්‍රහනය කර ඇති බවත් ඉතිරි සේවකයන් 30දෙනකු පමණ ස්ථාන මාරුවීමට සිටින බවත් මධ්‍යම රජයෙන් සේවකයන් ලැබෙන පරිදි නිදහස් කිරීමට කටයුතු කරන බවත් පැවසීය. එවිට නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා අදහස් දක්වමින් එසේ පවරාගෙන අදාල නිදහස් කිරීමේ කටයුතු සඳහා අඩුමතරමේ වර්ෂ දෙකක්වත් ගතවන බවත් සඳහන් කරන ලදි. |
| 07 | නින්දවුර් සංස්කෘතික ශාලාවේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම. (දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ගෙන 2025 වර්ෂයේ අයවැය යෝජනා සඳහා ඇතුළත් කිරීම) | දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.ඒ.එම්. තාහීර් මැතිතුමා විසින් මෙය 1997 වර්ෂයේ සැදීම ආරම්භකර විශාල ව්‍යාපෘතියක් බවත් එය නිමකර දෙන ලෙස ප්‍රදේශයේ ජනතාව ඉල්ලීම් කරන බවත් පැවසීය. මෙය තට්ටු 9ක ගොඩනැගිල්ලක් බවත් මේ සඳහා තවත් මිලියන 800ක වැනි විශාල මුදලක් අවශ්‍ය වන බවත් ප්‍රා.ලේ. සඳහන් කරන ලදී. මෙතරම් විශාල මුදලක් වැය කිරීම රාජ්‍ය මුදල් අපතේ යැවීමක් බව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා සඳහන් කරන ලදී. නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා අදහස් දක්වමින් මේසඳහා ලබාදීමට තරම් මුදල් නොමැති බැවින් එය කොටස් වශයෙන් නිම කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ඉංජිනේරුවරුන්ගෙන් විමසන ලෙස නින්දවුර් ප්‍රාදේශීය සභාවට දන්වන ලෙස අම්පාර සහකාර පළාත් පාලන කොමසාරිස්ට උපදෙස් දුනි.<br>මේ පිළිබඳ සොයාබැලීමට සියලුම දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා, දිස්ත්‍රික් ලේකම් ඇතුළු අදාල නිළධාරීන් සමඟ ඒකාබද්ධ සංචාරයක් කිරීමට තීරණය කරන ලදී. |
| 08 | ගැඹුරු මුහුදු ධීවරයින් සඳහා සන්නිවේදන කටයුතු පහසු කිරීමට සයින්දමරුදු ප්‍රදේශයේ පිහිටුවා ඇති රේඩියෝ සන්නිවේදන මධ්‍යස්ථානයෙහි නව රේඩියෝ සන්නිවේදන උපකරණ ස්ථාපිත කිරීම. | වරාය ක්‍රියාත්මක නොවූ නිසා ධීවරයින් බෝට්ටු වාලච්චේන ප්‍රදේශයට රැගෙන ගිය නිසා මෙම රේඩියෝ උපකරණ වාලච්චේන ප්‍රදේශයට ගෙනගොස් ඇති බැවින් නව සන්නිවේදන උපකරණ අවශ්‍ය බව දිගාමඩුලු දිස්ත්‍රික් |

| | | |
|---|---|---|
| | | පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආදම්බාවා මැතිතුමා විසින් සඳහන් කරන ලදී.<br>මාසයක් ඇතුලත මෙම කාර්යය නිම කරන බව දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උදුමා ලෙබ්බෙ මැතිතුමා විසින් පවසන ලදී. |
| 09 | කාර්තිව් - මාවඩිපල්ලි ප්‍රධාන මාර්ගයේ වීදි ලාම්පු සක්‍රිය කිරීම හා මාවඩිපල්ලි බටහිර ප්‍රදේශයෙහි ගංවතුර ආරක්ෂණ බැම්මක් ඉදිකිරීම. | දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිසාම් කාරියප්පර් මැතිතුමා විසින් මෙම වීදි ලාම්පු සක්‍රිය කිරීම ආරක්ෂණ බැම් ඉදිකිරීම මාර්ග සංවර්ධන අධිකාරියට අදාල කාර්යක් බව පවසන ලදී. මෙය ප්‍රාදේශීය සභාවට භාරදී ඇති බැවින් එය කිරීම ප්‍රාදේශීය සභාව විසින් කල යුතු බව මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් අධ්‍යක්ෂ පෙන්වා දෙන ලදී. නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා ප්‍රාදේශීය සභාවේ ලේකම්ගෙන් මෙය නඩත්තු කිරීමට මුදල් තිබෙනවාදැයි විමසන ලදී. ප්‍රාදේශීය සභාවේ ලේකම් තිබෙන බව පවසන ලදී. එසේ නම් ප්‍රාදේශීය සභාව මගින් එම කාර්යය කිරීමට තීරණය විය. |
| 10 | සම්මන්තුර බස් ඩිපෝව නැවත සක්‍රිය කිරීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා ඊට අදාල ලිපිය මේවන විට අමාත්‍යාංශයට යොමුකර ඇති බවත් එම කාරණාව ඉටුවන බවත් පවසන ලදී. |
| 11 | පෙරියනීලාවනි 71ඒ ග්‍රාම නිළධාරී වසම සඳහා ස්ථිර ග්‍රාම නිළධාරීවරයෙක් පත් කරගැනීම. | දිසාපති අදහස් දක්වමින් අම්පාර දිස්ත්‍රික්කයේ පවතින්නේ ග්‍රාම නිලධාරී වසම් 503ක් බවත්, මෙය 1172/8 ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති බවත් එය දෝෂ විශාල ප්‍රමාණයකින් සමන්විත වන නිසා එය පිළිගත නොහැකි බව සඳහන් කරමින් අමාත්‍යාංශයට කරුණු දක්වා යවා ඇති බවත් සඳහන් කරන ලදී. දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිසාම් කාරියප්පර් මැතිතුමා මෙය 2001 පෙබරවාරි 20 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්වුව අනුව කල්මුණ 71ඒ වසම සඳහා ග්‍රාම නිළධාරීවරයෙක් පත් කරන ලෙස සඳහන් කරන ලදී. එවිට දිසාපති විසින් එහි දෝෂ ඇති බව සඳහන් කරමින් අමාත්‍යාංශය වෙත දන්වා යවා ඇති බව පවසන ලදී. එවිට දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිසාම් කාරියප්පර් මැතිතුමා අමාත්‍යාංශයෙන් එය අවලංගු කරන තුරු ඒ අනුව කටයුතු කරන ලෙස දිසාපතිතුමන්ට පවසන ලදී. අම්පාර දිස්ත්‍රික්කයේ පවතින්නේ ග්‍රාම නිලධාරී වසම් 503ක් බවත් එය වෙනස් කිරීමට තමාට හැකියාවක් නොමැති බව දිසාපති දන්වන ලදී. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා මේ සම්බන්ධයෙන් අදාල ඇමතිතුමා සමඟ පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කොට මෙම ගැසට් ප්‍රශ්ණය විසඳා ගැනීමට තීරණය කරන ලදී. |
| 12 | ආක්‍රමණය කර ඇති වාරි බැමි කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම හා ඒවා ප්‍රතිසංස්කරණය කර ශක්තිමත් කිරීම. | දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආදම්බාවා මැතිතුමා විසින් මෙම ස්ථානවල නිතර නිතර බැම්ම කැඩීයාම නිසා කුඹුරු වලට හානි සිදුවන බව ගොවි සංවිධාන |

| | | |
|---|---|---|
| | අලිමුඩකාඩු සහ සින්නපල්ලිකාඩු - ඔලුවිල් | වලින් පැමිණිලි කරන බව සඳහන් කරන ලදී. ඒ සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ පිළිතුරු දෙමින් මේ පිළිබඳ ඩ්‍රෝන කැමරා මගින් පරීක්ෂා කර ඇති බවත් සති දෙකක පමණ කාලසීමාවකින් ඇස්තමේන්තු සකස්කර දෙන බවත් පැවසීය. |
| 13 | කාරතිවු ප්‍රදේශයේ පිහිටි වසර 50 කට වඩා පැරණි පාලම් 6 ක් ප්‍රතිසංස්කරණය කිරීම. | දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආදම්බාවා මැතිතුමා විසින් කාර්තිව් ගම ඇතුලත පැරණි කුඩා පාලම් 6ක් අලුත් වැඩියා කර දෙන ලෙස ප්‍රදේශ වාසීන් ඉල්ලීම් කරන බව පැවසීය. ප්‍රමුඛතාවය අනුව ප්‍රාදේශීය සභාව මගින් අලුත් වැඩියා කිරීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් දන්වන ලදී. |
| 14 | පනන්කාඩු, කාවඩපිට්ටි, මහාශක්ති, අලිගම්බෙ, පුලියම්පත්තෙ ගම්මාන වල කුඹුරු ප්‍රදේශ ආවරණය කරමින් සාගම මාර්ගය දිගේ අලි වැටක් ඉදි කිරීම. | වනජීවී දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ විසින් මෙය 2025 ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇති බවත්, ඒ සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය හිමිව ඇති බවත්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවත් සඳහන් කරන ලදී. ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව අනුමත කරන ලදී. |
| 15 | මධ්‍යම කඳවුර ජල ටැංකි කුළුණේ ඉදිකිරීම් කඩිනමින් සිදු කිරීම. | ජලසම්පාදන මණ්ඩලයේ නිළධාරියා විසින් මෙය ඉටුකල කොන්ත්‍රාත්කරු ඉවත්කර ඉතිරි වැඩ ඉටුකර ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කරගෙන යන බවත් 2025.02.13 දින අවසන් දින වන අතර ඉන්පසු මෙය අලුත් වැඩියා කිරීමට මාස 9ක් ගතවන බව පැවසීය.<br>මෙය කඩිනම් කිරීමට කටයුතු කරන ලෙස දන්වන ලදී. |
| 16 | ඉරක්කාමම් අරගා නගර්හි ජනාවාස වී ඇති පවුල් සඳහා ඉඩම් අයිතිය ලබා දීම. | ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් විසින් මෙ සම්බන්ධයෙන් දිසාපතිතුමන් විසින් දැනට ඉඩම්කච්චේරි පවත්වා ඉඩම් ලබා දීමට කටයුතු කරමින් පවතින බව සඳහන් කරන ලදී. |
| 17 | දෙහිඅත්තකණ්ඩිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ පවුල් සෞඛ්‍ය නිලධාරී කාර්යාල බොහෝමයක ජල/ විදුලි/ වැසිකිළි පහසුකම් නොමැති වීම. | දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගරු රත්වත්තේ මැතිනිය විසින් දෙහිඅත්තකණ්ඩිය පවුල් සෞඛ්‍ය නිළධාරී කාර්යාල 10ක වැසිකිලි පහසුකම් නොමැති බවත්, 6ක විදුලි සැපයුම නොමැති බවත්, 3ක ජල සැපයුම් නොමැත් බවත්, 3ක ජල සැපයුම තිබුණද ජලනල එලා නොමැති බවත් සඳහන් කරන ලදී. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මෙම කටයුතු ඉටු කිරීම සඳහා අම්පාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දැනුම්දී ඇති බව සඳහන් කරන ලදී.<br>පළාත් සභාවටද අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස දැන්වීය. |
| 18 | පසුගිය ගංවතුර තත්ත්වය නිසා මහඔය නුවරගලතැන්න පාලම අසල අධික ලෙස වැලි තැම්පත් වීමෙන් මාර්ගය හා පාලම අවදානම් තත්ත්වයකට පත් වී තිබීමේ ගැටළුව නිරාකරණය කිරීම. | මහඔය ප්‍රාදේශීය ලේකම් විසින් මෙම පාලම කැඩිගිය හොත් අම්පාර මහඔය සම්බන්ධතාව බිඳෙන බවත් ගඟේ මැද වැලි තැන්පත්වීම නිසා ගඟේ රටාව වෙනස්විම මගින් පාලමේ එක් අන්තයක් සෝදා යාමට ලක්ව ඇති බව සඳහන් කරන ලදී. මෙම වැලි නිධිය ඉවත්කර ගඟේ රටාව නැවතත් සෑදීමෙන් මෙය වලක්වා ගත හැකි බව යෝජනා කරන ලදී. ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අවසරය අවශ්‍ය බවත් සඳහන් කරන ලදී. දිසාපති අදහස් දක්වමින් ඒ සඳහා භූ විද්‍යා, මාර්ග සංවර්ධන අධිකාරිය, මහවැලි අධිකාරිය, වන |

| | | |
|---|---|---|
| | | සංරක්ෂණ යන ආයතනවල අනුමැතිය අවශ්‍ය බව පෙන්වාදුනි. දිසා වන නිළධාරී ඒ සදහා අනුමැතිය ලබා දීමට කටයුතු කරන බව පැවසීය. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් ඒ සදහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදීමට තීරණය කරණ ලදී. මෙම කරුණට අදාලව සහ අනෙකුත් ස්ථාන සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට 2025.02.18 දින රැස්වීමක් සංවිධානය කර ඇති බව දිසාපති විසින් පවසන ලදී. |
| 19 | මහඔය 69 හන්දිය අසල පිහිටි අලුත්වැඩියා කළ යුතු මට්ටමේ පවතින වී ගබඩා දෙක කඩිනමින් අළුත්වැඩියා කිරීම සදහා වෙළද අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කිරීම. | මැතකදී වී අලෙවි මණ්ඩලයෙන් ලක්ෂ 28ක ප්‍රතිපාදන ලැබුණ බවත්, ඒවා දමන සහ උහන වී ගබඩා ප්‍රතිසංස්කරණය සදහා යොදාගත් බවත් නැවත මුදල් ලැබීමේදී මින් එක් ගබඩාවත් හෝ අලුත් වැඩියා කිරීමට කටයුතු කරන බව දිසාපති පවසන ලදී. වී අලෙවි මණ්ඩල නිළධාරියා සදහන් කර සිටියේ මින් එක් ගබඩාවක් සදහා ලක්ෂ 22 සහ අනෙක් ගබඩාව සදහා ලක්ෂ 29ක් ඇස්තමේන්තු කර ඇති බවයි. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් මෙයින් එක් ගබඩාවක් හෝ අලුත් වැඩියා කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සහිතව වෙළද අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලබාගැනීමට ලිපියක් යැවීමට තීරණය කරන ලදී. |
| 20 | මාදුරුඔය වනෝද්‍යානයේ ඇති පැරණි තේක්ක වගාවෙහි අනවසර දැව හෙලීම් සිදුවන බැවින් දැව සංස්ථාව මගින් නීත්‍යානුකූලව එම වන වගා ඉවත් කර වන සතුන්ට හිතකර දේශීය ශාක සිටුවීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කිරීම. | පදියතලාව ප්‍රාදේශීය ලේකම් විසින් මෙම යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කර අනුමැතිය සහිතව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව සදහන් කරන ලදී. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ ඒ සදහා දැව සංස්ථාව වෙත අවසරය ලබා දී ඇති බව සදහන් කරන ලදී. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් දැව සංස්ථාව සම්බන්ධයෙන් විශාල වශයෙන් පැමිණිලි ලැබෙන බවත්, පෞද්ගලික අවධානම් ගස් කපා ඉවත් කිරීම, රාජ්‍ය ආයතන වල ඇති අවධානම් සහිත ගස් කපා ඉවත් කිරීම, මෙම මාදුරුඔය වනෝද්‍යානයේ තේක්ක ගස් 10000-12000 පමණ ඉවත් කිරීමට ඇති බවත් ඒවා රජයේ ආදායම් බවත් පැවසීය. තවද දැව සංස්ථාවෙන් විශාල ප්‍රමාදයන් සිදුවන බවත් පැවසීය. දැව සංස්ථාවේ නිළධාරියා විසින් මෙය ඩ්‍රෝන කැමරා මගින් නිරීක්ෂණය කර කොළඹට යවා ඇති බවත්, එහි නිළධාරීන් පැමිණ සිදුකරන පරීක්ෂාවෙන් පසු කටයුතු කරන බවත් පැවසීය. මේ සදහා අම්පාර සිටින නිළධාරීන් ප්‍රමාණවත් නොවන බවත් විශාල සේවක හිගයක් පවතින බවත් සදහන් කරන ලදී.<br>නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා අදහස් දක්වමින් රාජ්‍ය නිළධාරීන් කටයුතු කරගෙන යාමේදී පවතින පැරණි නීති රීති අණ පනත් සුදුසු ආකාරයට වෙනස් කිරීමට අවශ්‍ය නම් ඒවා මෙම මන්ත්‍රීතුමන්ලා මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලීම් කරන ලදී. |

| | | |
|---|---|---|
| | | |
| 21 | අම්පාර - මඩකලපුව දිස්ත්‍රික් මායිමේ පිහිටි වඩිච්චලේ ප්‍රදේශයේ (මහඔය ප්‍රා.ලේ. කොට්ඨාසයේ ටැම්පිටිය ග්‍රාම නිලධාරී වසමට අයත්) වැලි කැනීම් කටයුතු කිරීමට වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් විසින් බලපත්‍ර ලබාදීම හා මඩකලපුව දිස්ත්‍රික් ජනතාව ටැම්පිටිය ප්‍රදේශයේ ඉඩම් වල බලහත්කාරයෙන් පැමිණ වගා කටයුතු කිරීම. | රඹකැන්ඔය නේවාසික ව්‍යාපෘති කලමණාකරු අදහස් දක්වමින් දිස්ත්‍රික් මායිම් නිශ්චිතව නොමැති නිසා මෙම ප්‍රශ්ණය උද්ගතව ඇති බව පවසන ලදී. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා දිසාපතිතුමාට, මහඔය ප්‍රාදේශීය ලේකම්, මඩකලපු දිසාපතිතුමා සහ වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් සමග මෙම ගැටළුව මෙම මාසය තුල සාකච්ඡා කරන මෙන් දැන්විය.<br>එය සාර්ථක නොවන්නේ නම් අම්පාර සහ මඩකලපු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති දෙදෙනාද සම්බන්ධකර ගෙන සාකච්ඡා කිරීමට තීරණය විය. |

## 11. සාකච්ඡා කල වෙනත් යෝජනා

- අම්පාර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී උදුමා ලෙබ්බෙ මැතිතුමා විසින් පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ගත් තීරණවල ප්‍රගතිය සදහන්ව නොමැති බව පවසන ලදී. එවිට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ගත් තීරණ ක්‍රියාත්මක කිරීමේදී අදාල ආයතන වලට ගැටළු පවතීනම් ඒවා සාකච්ඡා කිරීම සදහා න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

- අම්පාර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී උදුමා ලෙබ්බෙ මැතිතුමා විසින් පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී තමා විසින් ඉදිරිපත් කල කාරණා රැස්වීම් වාර්ථාවේ සදහන්ව නොමැති බව සදහන් කරන ලදී. එවිට දිස්ත්‍රික් ලේකම් මේ පිළිබද සොයා බලන බවත්, න්‍යාය පත්‍රයේ ඇතුලත් සාකච්ඡා කල සියළුම කරුණු සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ගනුලැබූ තීරණ වලට අදාල ආයතන මගින් සති දෙකක් තුළ ප්‍රගතිය ලබාගෙන එය අම්පාර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත සහ අදාල අංශ වෙත යොමු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

- දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නිසාම් කාරියප්පර් මැතිතුමා මෙම සම්න්ධීකරණ කමිටුවේ දැනට පැරණි මන්ත්‍රීවරුන් දෙදනකු පමණක් සිටින බැවින් විමධ්‍යගත වැඩසටහන සදහා යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන ක්‍රියාදාමය නවක මන්ත්‍රීන්හට පවසන මෙන් ඉල්ලා සිටින ලදී.
  එවිට අම්පාර දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂ විසින් මෙවර මන්ත්‍රීවරුන්ට වෙනම ප්‍රතිපාදන ලබාදී නොමැති බවත් ප්‍රාදේශීය ලේකම් විසින් එම යෝජනා අදාල මන්ත්‍රීන් සමඟ සාකච්ඡාකර ඉදිරිපත් කල යුතු බවත් පැවසීය.

- දිගාමඩුලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනී ගරු රත්වත්තේ මැතිනිය විසින් දෙහිඅත්තකණ්ඩිය වැව්මැදගම ප්‍රදේශයේ වන අලි ගැවසෙන ප්‍රදේශයක් බවත්, එම ප්‍රදේශයේ රාජ්‍ය නිළධාරීන් සහ ප්‍රදේශවාසීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් කර පවතින අලිවැට වැව ආසන්නයෙන් ගැසීමට තීරණය කරණ ලදී. ඒ අනුව වනජීවී සහකාර අධ්‍යක්ෂතුමන්ගෙ අවසරය ඇතිව ප්‍රාදේශීය සභාවේ යන්ත්‍ර භාවිතයෙන් කටයුතු කිරීමේදී වනජීවී සහකාර අධ්‍යක්ෂ විසින් එය නතර කරන ලෙස දැන්වීමෙන් පසු එම ක්‍රියාදාමය මේ වන විට නතරව ඇත. එය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය බව එතුමිය සදහන් කරන ලදී.
  වනජීවී සහකාර අධ්‍යක්ෂ, අලි වැට වෙනස් කිරීමේ බලය තමා සතුව නොමැති බවත් සියළුම තොරතුරු මේවන විට අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බවත් එහිදී අමාත්‍යාංශයෙන් ඒ සදහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාගෙන එවන මෙන් දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදී.
  දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා එය මුළු ගමම සිදුකරන ඉල්ලීම බැවින් එය කිරීම සදහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන බව පැවසීය.

- දිසාපති විසින් දමන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු තීරණයක් දමන ප්‍රාදේශීය ලේකම් විසින් එවා ඇති බව සඳහන් කරන ලදී. 2023.06.12 දින පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණයක් මත එග්ගල්ඔය වීරවින්න ප්‍රදේශයේ මිරිස් වගාවට ඇති ඉඩම් නැවත මිරිස් වගාවට අවශ්‍ය වන විට ලබාදීමේ හා ගොවීන්ගේ ඉල්ලීම මත උක් වගාව වෙත ලබාදී තිබූ බවත්, දැනට කන්න දෙකක් වගාකර ඇති බවත් පැවසීය. දැන් එම ඉඩම් මිරිස් වැවීම සඳහා අවශ්‍ය බවත් ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.
  දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා දෙන ලදී.

- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් මහඔය බොරපොල සිවිල් ආරක්ෂක බලකා කඳවුර පිහිටි ඉඩම වෙනත් අයකුගේ බැවින් මේවන විට ඔවුන් එයින් ඉවත්කර තිබෙන බවත් පැවසීය. ඒ සඳහා ඔවුන්ට ඉඩමක් ලබාදෙන මෙන් ඉල්ලීම් කර ඇති බවත් සඳහන් කරන ලදී. එවිට මහවැලි අධිකාරිය විසින් බොරපොල ප්‍රදේශයේ පර්චස් 18 පමණ ඉඩමක් ලබාදී බලකා කඳවුර සහ අලිවැට රාජකාරී සඳහා යොදවාගෙන සිටින විට එහි පොල්පැල කීපයක් සිටුවීමට යෑමේදී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් විරුද්ධ වී එම ඉඩම බිබිල ප්‍රදේශයේ අයකුගේ සහ හිටපු අමාත්‍ය ගරු සරත් වීරසේකර මැතිතුමාගේ පුතාගේ බවත් සඳහන් කර ඇත. එනිසා එම අක්කර 3ක් වන සම්පූර්ණ ඉඩමම සිවිල් ආරක්ෂක බලකා කඳවුරට සහ ව්‍යාපෘතියක් කිරීම සඳහා ලබාදීම සුදුසු බව යෝජනා කරන ලදී. මහවැලි අධිකාරි නිළධාරියා එම ඉඩම් තවම කිසිවෙකුට ලබාදී නොමැති බවත් වෙනත් අයකුගේ ඉල්ලීමට මැනුමක් පමණක් කර ඇති බවත් සඳහන් කරන ලදී. එම ඉඩම තාමත් රජය සතු බවත් සඳහන් කරන ලදී.

- දිගාමඩුල්ල පුද්ගලික බස් සමාගමේ සභාපති විසින් අම්පාර ප්‍රදේශයේ ප්‍රවාහනයේ විශාල අඩුපාඩු කම් පවතින බවත්, දැනට අම්පාර ඩිපෝවේ අධිකාරීවරයෙකු නොමැති බවත්, ලංගම සහ පෞද්ගලික බස් ඒකාබද්ධ කාල සටහන් ක්‍රියාත්මක නොවීමත්, අම්පාර ගමනා ගමන මණ්ඩලයෙන් විශාල අඩුපාඩුකම් සිදුවන බවත් පැවසීය.
  පළාත් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ නිළධාරියා විසින් ඒකාබද්ධ කාල සටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් 18 දින සංවිධානය කර ඇති බව සඳහන් කරන ලදී.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍ය ගරු වසන්ත පියතිස්ස මැතිතුමා විසින් පැමිණි සිටි සියලු දෙනාට ස්තූතිය පළකර සිටින ලද අතර ස්තූති කථාව සඳහා නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමාට ආරාධනා කරන ලදී.

## 12. ස්තූති කථාව

නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ගරු මහාචාර්ය ජේ.එල්. රත්නසේකර මැතිතුමා පසුගිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට සහභාගී වීමට නොහැකි වූයේ අත්‍යාවශ්‍ය කාරණයක් සඳහා කොළඹ යාමට සිදුවීම නිසා බවත්, මේ සඳහා සහභාගී වීමෙන් පළාත් සභාව, මධ්‍යම ආණ්ඩුව හා වෙනත් ආයතන මගින් සිදුකරන සංවර්ධන ව්‍යාපෘති අතර සිදුවන අක්‍රමිකතා වලක්වා ගැනීමට හැකිවන බවත් නව රජයේ ප්‍රතිපත්තිය අනුව පළාත් සභා මධ්‍යම රජය ලෙස වෙන වෙනම නොව එක්ව කටයුතු කිරීම සඳහා සියළුම නිළධාරීන්ගේ සහය අවශ්‍ය බවත් සඳහන් කරමින් පැමිණ සිටි සියළුම දෙනාට ස්තූතිය පිරිනමමින් සභාවේ කටයුතු අවසන් කරන ලදී.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්
අම්පාර.

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය